# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2400/42 - 2024 සැප්තැම්බර් මස 06 වැනි සිකුරාදා - 2024.09.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : 11/3/3/1/14R.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : LD/05/2008/MV/408-L.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :-

මෙහි මහජන කටයුත්තක් යනු මොරගහකන්ද හා කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කළුගඟ දකුණු ඉවුර සංවර්ධන කටයුතු සඳහා ඉඩම් අත්පත්කර ගැනීම වේ.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ලග්ගල පල්ලේසිය පත්තුවේ E396B අකරහැඩිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් 2023.03.10 දින සම්මත කරන ලද, කැ.සි. 310243 හි, කලාප අංක 22 හි, පත්‍ර අංක 2 දරන සැලැස්මේ, බිම් ප්‍රමාණය හෙක්ටයාර් 2.8910 ක් වන පහත විස්තර සඳහන් ඉඩම :

01. කැබලි අංක **01**

ඉඩමේ නම: අලියාවැටුනහේන්යාය; විස්තරය: ගෙවතු, මාර්ග, ජලමාර්ග; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් පාන්නා : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ඉඩම් ප්‍රමාණය: හෙක්ටයාර් 2.8910.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් **හෝ 2024 ඔක්තෝබර් මස 21 වැනි දින පෙ.ව. 09.00** ට ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, **2024** ඔක්තෝබර් මස **14** වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, ඒකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

**ස්වර්ණා පෙරේරා,**
ප්‍රාදේශීය ලේකම්,
ලග්ගල.

2024 සැප්තැම්බර් මස 02 වැනි දින,
ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09 - 0060



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

සංශෝධනයයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : KDS/UDP/4/1/02/03.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/8/2020/CEB/08.

**මොරගොල්ල විලේජ් නව ගම්මානය සඳහා පිවිසුම් මාර්ගය ඉදි කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම**

ඉහත ශීර්ෂය යටතේ අංක 2310/08 හා 2022.12.12 දිනැතිව මා විසින් පළ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* වන්දි පරීක්ෂණ දිනය සහ වේලාව පමණක් 2024.10.23 දින පෙ.ව. 10.00 ලෙස සංශෝධනය කරන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

**ආත්මා දිලුක්ෂි ජයරත්න,**
ප්‍රාදේශීය ලේකම්,
උඩපළාත.

2024 අගෝස්තු මස 26 වැනි දින,
උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09 - 0061

---

ශුද්ධි පත්‍රිකාව

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියට යටත්ව අංක 2300/11 හා 2022.10.04 දිනැති ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද දැන්වීමේ 3ඒ පිටුවේ සඳහන් කැඩැස්තර සිතියම් අංක 511860 හි කලාප 06, පත්‍ර 01 හි කැබලි අංක 33 හා 34 යන ඉඩම් කොටස් මැනුම් සංශෝධන පරිදි කැඩැස්තර සිතියම් අංක 511860 හි කලාප 06, පත්‍ර 02 හි කැබලි අංක 1, 2, 3 හා 4 ලෙස විභජනය වී ඇති අතර එම කැබලිවලට අදාළ ඡේද පහත පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: මාරගහකුඹුර; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් කියන අය : ඒ.ආර්.එන්. සමරතුංග, අංක 10, ශාන්ති පාර, ගම්පහ (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0634

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: —; ඉඩමේ විස්තරය: ඇළ; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් කියන අය : සොයාගත නොහැක (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0030

03. **කැබලි අංක 03**
ඉඩමේ නම: මිදෙල්ලගහකුඹුර; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් කියන අය : වික්‍රම ආරච්චි අප්පුහාමිලාගේ පියසිංහ, අංක 55/7, කනත්ත පාර අස්ගිරිය, ගම්පහ (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0102

04. **කැබලි අංක 04**
ඉඩමේ නම: —; ඉඩමේ විස්තරය: ඇළ; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් කියන අය : සොයාගත නොහැක (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0028

**කේ.ජී.එස්.එල්. ගුණතිලක,**
ප්‍රාදේශීය ලේකම්,
ගම්පහ.

2024 අගෝස්තු මස 28 වැනි දින,
ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09 - 0062

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.